**ඇමුණුම 01**

| | පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **01** | **<u>සේවා පළපුරුද්ද - 60</u>** | |
| | I. තනතුරට අදාල ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය වසරක් සඳහා ලකුණු 05 ක්ද වසරකට අඩු මාස 06 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 02 1/2 ක්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 50 |
| | II. ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ ලෙස) අදාල පූර්ව පලපුරුද්ද (උපරිම වසර 5 ක් සඳහා) වෙනුවෙන් වසරකට ලකුණු 02 බැගින් ද මාස 06 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 01 බැගින්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 10 |
| **02** | **<u>කුසලතාවය - 40</u>** | |
| | **I. අධ්‍යාපන සුදුසුකම්** | |
| | නිලධාරින් සේවයට බඳවා ගැනීමේදී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම් වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාල හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාල වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක්කරනු ලැබේ.<br>අ.) පශ්චාත් උපාධිය - ලකුණු 15<br>ආ.) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 10<br>• ලබා ඇති ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ | 15 |
| | **II. වෘත්තීය සුදුසුකම්** | |
| | (අ) (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - 10<br>(දේශීය/ විදේශීය)<br>(ii) එම ක්ෂේත්‍රයේ මාස 06ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - 05 | 10 |

| | | |
|---|---|---|
| | (ආ) ආයතනය විසින් තීරණය කරන තනතුරට අදාල ක්ෂේත්‍රයේ සම්පූර්ණ කරන ලද අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certifications) සඳහා කාලසීමාව නොසලකා ඉහත 2 (II) (අ) (i)<br>යටතේ සැලකීමට ලක් කෙරේ.<br>උදා - 1) BCS/ ACS<br>2) Microsoft Certifications<br>3) Sun Certifications<br>4) Cisco Certifications<br>5) CISSP Certifications<br>6) etc... | |
| | **III. විශේෂ කාර්යයන්/ දායකත්වයන්**<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව සිදු කරන ලද නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>(අ) නව නිර්මාණ, වැඩි දියුණු කිරීම්,ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා ලකුණු 10<br>(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම්/ ආයතන ප්‍රධානියා විසින් සහතික කල ප්‍රශංසා 01ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05ක් සඳහා පමණක් එනම් උපරිම ලකුණු 05ක් පමණක් ලබාදෙනු ලබන අතර අයදුම්කරුවෙකුට ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 05ක් ලබා ගැනීමෙන් පසු ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා මෙම සුදුසුකම යටතේ ලබාදෙන ඉතිරි ලකුණු 05ක් ද ලබා ගත හැකිය.<br>ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා<br>උදාහරණ :<br>1) මෘදුකාංග නිර්මාණය/ සංවර්ධනය (Software Designing/ Development)<br>2) ජාල පරිපාලනය (Network Administration)<br>3) පද්ධති පරිපාලනය (System Administration)<br>4) දත්ත පාදම පරිපාලනය (Data Base Administration)<br>5) සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.) | 10 |

| | | |
|---|---|---|
| | සැ. යු.<br>❖ නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් අයදුම්කරු විසින්ම සිදු කල බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි.<br>❖ ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබා ගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කල යුතුය.<br><br>**IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව**<br><br>අ.) නායකත්වය - ලකුණු 02<br>ආ.) සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>ඇ.) වෘත්තීය ආචාරශීලීභාවය - ලකුණු 01 | 05 |